කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**බාහිර විභාග අංශය**

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2009**
**2010 අගෝස්තු / සැප්තැම්බර්**

**සමාජීය විද්‍යා පීඨය**

**භූගෝල විද්‍යාව- GEOG –E3015**

**ප්‍රාදේශීය භූගෝල විද්‍යාව - ශ්‍රී ලංකාව හා දකුණු ආසියාව**

**එක් කොටසකින් ප්‍රශ්න දෙකක් වත් තෝරාගෙන**
**ප්‍රශ්න <u>පහකට (05)</u> පිළිතුරු සපයන්න**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි** **කාලය :පැය 03 යි**

---

## <u>1 වන කොටස - ශ්‍රී ලංකාව</u>

01. ශ්‍රී ලංකාවේ මුහුණුවර සැලැස්ම සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති න්‍යායාත්මක අදහස් සංසන්දනාත්මකව අගය කරන්න.

02. ශ්‍රී ලංකාවට වර්ෂාපතනය ලබාදෙන මූලයක් වශයෙන් මෝසම් ක්‍රියාකාරිත්වයේ සාපේක්ෂ වැදගත්කම සාකච්ඡා කරන්න.

03. සංවර්ධන ප්‍රවේශයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ හා ක්‍රියාත්මක වන ඒකාබද්ධ ග්‍රාමීය ව්‍යාපෘතීන්ගේ සාර්ථකත්වය නිදසුන් සහිතව විග්‍රහ කරන්න.

04. මතු දැක්වෙන මාතෘකාවලින් <u>**එකක් (01)**</u> පිළිබඳව භූගෝල විද්‍යාත්මක විග්‍රහයක් කරන්න.

   i. ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රශ්නය නිරාකරණය කිරීමේ වැඩ පිළිවෙල

   ii. ශ්‍රී ලංකාවේ ජනසංඛ්‍යා ප්‍රක්ෂේපණ මගින් හඳුනා ගත හැකි සමාජ - ආර්ථික ගැටලු

   iii. වියළි කලාපීය සංවර්ධන වැඩ සටහන්

   iv. ශ්‍රී ලංකාවේ බෝග විවිධාංකරනයට ඇති විභවතා හා එහි අවශ්‍යතාව

## 11 වන කොටස - ශ්‍රී ලංකාව හැර දකුණු ආසියාව

05. දකුණු ආසියාවේ භූගෝලීය ලක්ෂණයන්හි අවකාශීය විෂමතා තුළින් මතු වී පෙනෙන ඒකීයත්වයට තුඩු දී ඇති සාධක පරීක්‍ෂා කරන්න.

06. ඉන්දීය උප මහාද්වීපය, භූ විද්‍යාත්මක හා භූ රූප විද්‍යාත්මක කලාපවලට බෙදා වෙන් කිරීමේ දී මුහුණ පාන්නට සිදුවන ගැටලු සාකච්ඡා කරන්න.

07. ඉන්දියාවේ හා පකිස්ථානයේ කෘෂිකර්මාන්තයට නවතාක්ෂණය යොදා ගැනීමෙන් ඇති වී තිබෙන ප්‍රතිඵල සංසන්දනාත්මකව අගය කරන්න.

08. බංග්ලාදේශයේ කාර්මික විභවතාවන් කෙරේ අවදානය යොමු කරමින් එහි කාර්මික සංවර්ධනය කිරීමේ හැකියාව පරීක්‍ෂා කරන්න.

***********************